

# 76 වන නිදහස් දිනය අදයි



# නිදහස හා සහජීවනය

**මෙලොව උපන් සෑම සත්ත්වයකුට ම උපතින් ම යම් නිදහසක් උරුම වී තිබේ. ජීවත්වීමේ නිදහස ඉන් පළමු වැන්නයි. අනවශ්‍ය බැඳීම්, යටත්වීම් සහ පීඩනයන්ගෙන් තොරව නිදහසේ ජීවත්වීමට සැවොම ප්‍රිය කරති. නිදහස තනි පුද්ගලයකු වශයෙන් හා පවුලක සාමාජික පිරිසක් වශයෙන් භුක්ති විඳීම එහි මූලික අවස්ථාව ලෙස දැක්විය හැකිය. එය සාමූහිකව රටක් ජාතියක් ලෙස භුක්ති විඳීම නිදහසේ පොදු අවස්ථාව ලෙස දැක්විය හැකි ය.**

සියලු සත්ත්ව වර්ගයා ජීවත්වනුයේ එකම සමාජයක ඒකාකාරී රාමුවක් තුළ ය. එක් මිනිස් වර්ගයක නිදහස පිළිබඳ යම් යම් සීමා පැනවීම හෝ නිදහස සහමුලින්ම අහෝසිකර දැමීම මානුෂික වශයෙන් මෙන් ම සදාචාරාත්මක වශයෙන් කිසි හේතු යුක්ති සහගත ක්‍රියාවක් නොවේ. ලොව ජීවත්වන සියලු සත්ත්ව වර්ගයාට උත්තරීතර මානව නිදහසක් උදාකරදීම සඳහා වූ සර්වකාලීන හා ඉගැන්වීමක් පළමුවෙන් ම ලෝකයාට ඉදිරිපත් කළේ බුදුරජාණන් වහන්සේ ය. ප්‍රාග් බෞද්ධ හා බුද්ධකාලීන භාරතීය සමාජ පසුබිම පිළිබඳ විමසා බැලීමේ දී එකල මිනිසුනට යටත් පිරිසෙයින් ජීවිතය පවත්වාගෙන යාමටවත් කිසිදු නිදහසක් උරුමව නොපැවතුණි. බමුණන් විසින් වර්ග කරන ලද චතුර්වර්ණය පදනම් කරගෙන එකල සමාජය සකස්ව තිබුණි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය වෛශ්‍ය හා ශුද්‍ර යනු එම චතුර්වර්ණයයි. මෙම වර්ගීකරණයට අනුව බමුණන්, පූජකයන් හා ගුරුවරුන් ලෙස ද රජුගේ උපදේශකවරුන් ලෙස ද පෙනී සිටි අතර මිනිස් සමාජය උසස් පහත් වශයෙන් මහා බ්‍රහ්මයා විසින් මවන ලදැයි යන්න ඔවුන ගේ නිසැක පිළිගැනීම විය. ක්ෂත්‍රිය වංශිකයනට රාජ්‍ය පාලන තන්ත්‍රය මෙහෙයවීමත්, කෘෂි කර්මාන්තය කරවීමත්, යාග කරවීමත් නියමිතව පැවතිණි. වෛශ්‍යයනායට වාණිජමය කටයුතු පැවරී තිබුණ අතර ශුද්‍ර වංශිකයාට උරුම වූයේ පූර්වෝක්ත වර්ණත්‍රයට බැලමෙහෙවර කිරීමයි. මෙකී වර්ණත්‍රයට උරුම වූ මිනිස් අයිතිවාසිකම් කිසිවක් ඔවුනට උරුම නොවීය.

එමතු නොව තත් යුගය වනවිට භාරතීය සමාජයේ කාන්තාවනට හිමිවූයේ ද ඉතා පහත් තත්ත්වයකි. ශුද්‍රයිනට සේම සාමාන්‍ය මිනිස් අයිතිවාසිකම් වූ ඉගෙනීම හා ආගමික කටයුතුවල යෙදීම ආදී කටයුතු පවා ඔවුනට අහිමි විය. රටේ පවත්නා පොදු නීති පවා කාන්තාව සම්බන්ධයෙන් වෙනස්වූ අතර එදා සමාජයේ කාන්තාවක මැරීම පිරිමියෙකු මැරීම තරම් බරපතළ ක්‍රියාවක් නොවේය යන අදහස ද මුල් බැසගෙන පැවතිණ. එබැවින් එකල ස්ත්‍රියක වී ඉපදීම ද බරපතළ පාපයක් සේ සැලකිණ. මෙසේ සකස්ව පැවැති විෂම සමාජ රටාවෙහි පවත්නා නිස්සාරත්වය මනාව මහජනයාට තේරුම් කරදුන් බුදුරජාණන් වහන්සේ උපතින් කෙනෙකු බ්‍රාහ්මණයෙකු හෝ වසළයකු නොවන බවත්, එය පුද්ගල ක්‍රියාකාරකම් මත තීරණය වන බවත්, තර්කානුකූලව පැහැදිලි කළහ. ඒ ඇතුළු මිනිස් සමාජයේ නිදහස වෙනුවෙන් උන්වහන්සේ සිදුකළ දේශන සියල්ල මංමුළා වූ ජන සමාජයකට නිසි මග පෙන්වාදීමක්ම විය.

බුදුරදුන් දේශනා කළ ශ්‍රී සද්ධර්මය ශ්‍රී ලංකාවාසීන්ට හඳුනා ගැන්මට ලැබුණේ ක්‍රි.පූ. 3 වැනි සියවසේ දී නොහොත් බුද්ධ වර්ෂ 236 දී සිදු වූ මහින්දාගමනයෙන් පසුව යි. එවකට ලාංකේය පරිසරයේ සැකැස්ම ද ප්‍රාග් බෞද්ධ හා බුද්ධකාලීන භාරතීය බ්‍රාහ්මණ ඒකාධිකාරය තරම් ම දරුණු මට්ටමක නොපැවැතිය ද එහි යම් යම් කොටස් ශේෂව පැවැති ස්වභාවයක් පෙන්නුම් කළැයි පිළිගත හැකි ය. මෙලොව පරලොව උභයාර්ථ සංසිද්ධිය කෙසේ සලස්වා ගත යුතු දැයි, යන්න පිළිබඳ අල්පමාත්‍ර දැනුමක් හෝ නොතිබුණු ජන සමාජයකට මානව නිදහස පිළිබඳ පැවැතියේ ද කිසිවෙකුටත් හිතකර නොවූ සංකල්පයන් ය. එම සංකල්පනාවන්ට නව අරුතක් එක් කිරීම තුළින් රටට උදාවූයේ පෙර කිසිදාක නොවූ විරූ ආලෝකයෙකි.

මිහින්තලා පර්වතය අසල දී මිහිඳු මහරහතන් වහන්සේ විසින් දෙවන පෑතිස් රජුට දේශනා කළ එක් දහම් පණිවුඩයක් මෙසේ ය.

'මහරජ, ඔබට මෙන් ම ගුවනේ සැරිසරන පක්ෂීන්ට ද වන සතුන්ට ද මේ රටේ ඕනෑම තැනෙක නිදහසේ ජීවත්වීමේ හා ඔබමොබ යාමේ සම අයිතියක් ඇත. පොළොව රටවැසියාට සහ අනෙකුත් සතුන්ට ද අයිති වන අතර ඔබ එහි භාරකරු පමණෙකි'.

මෙලෙස සත්ත්වයා ගේ නිදහස පිළිබඳ ඉහළම වැටහීමක් ලබාගත් මෙරට ජනයා ගේ බුද්ධිය, ක්‍රියාකාරිත්වය හා යහපත් වූ අන්තර් පුද්ගල සබැඳියාව ඉතා ඉහළම මට්ටමකින් පෝෂණය වූවාක් සේ ම නිදහස් චින්තනයේ අඩිතාලම් සියවස් ගණනාවක් පුරාවට ම නොසිඳී නොකැඩී රඳා ගැන්මෙහි ද හැකියාව ලැබිණ.

මෙරට ජනතාව ගේ චිත්ත සන්තානය තුළ තදින්ම පැලපදියම් වූ මෙකී හැදියාව නොපිටට පෙරළී ගියේ යුරෝපීය ධන කුවේරයන් මෙරට ආක්‍රමණයෙන් පසු ඇති කළ සමාජ පරිවර්තනයත් සමග ය. විවිධ ආක්‍රමණිකයන් ගේ බලපෑම්වලට ලක් වූ අප ඉතිහාසයේ එක් යුගයක පරාධීන ජාතියක්ව සිටීමට සිදුවීම ජාතියක් ලෙස අත්විඳි අවාසනාවන්ත සිදුවීමක් ලෙස පෙන්වාදිය හැකි ය. ඒ තුළ දේශීය සංස්කෘතිය වෙනුවට බටහිර අනුකරණශීලී සමාජ රටාව ලක්දිව පුරා ව්‍යාප්ත වන්නට විය. තවමත් එහි යම් යම් ශේෂ පවතිනු දක්නට ලැබීම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි.

සියවස් කිහිපයක් පරාධීනව සිටින රටක් තව දුරටත් පරාධීනත්වයට ම ඇඳ වැටෙන්නේ නම් ඔවුනට ස්වාධීනත්වය පිළිබඳ ඇතැම්විට කිසිදු හැඟීමක් ඇති විය නොහැකි ය. ඔවුනට ස්වාධීනත්වයෙහි ස්වරූපය පිළිබඳ අත්දැකීම් බිඳකුදු නොමැති හෙයිනි. නමුත් වර්ෂ 1505 දී මෙරටට ප්‍රථම පෘතුගීසි ආක්‍රමණිකයා වන ලොරෙන්සො ද අල්මේදා ගේ පැමිණීමට පෙර වසර දහස් ගණනක් තිස්සේ ස්වාධීනත්වයේ හා සාමකාමී ජීවන රටාවක අත්දැකීම් මෙරට ජනතාව අත්විඳ ඇත්තාහ. එබැවින් පැවැති නිදහසට එරෙහි විකල්ප බලවේග පැමිණීම හමුවේ අප රටවාසීහු එකී බලවේගයන්ට එරෙහිව නැගී සිටියහ. නැගී එන දේශානුරාගයෙන් හා නිදහස ලබා ගැනීමේ පරම පවිත්‍ර අපේක්ෂාවෙන් යුත් මනසින් හෙබි අප ශ්‍රේෂ්ඨ මුතුන්මිත්තෝ දැයේ නිදහස හා ස්වාධීනත්වය අහිමි කළ අධිරාජ්‍යවාදයට එරෙහිව සෘජුව ම ක්‍රියා කළහ. එම ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍ර නාමාවලියෙහි අප දන්නා කුඩාපොල හිමි, වාරියපොළ ශ්‍රී සුමංගල අනු නා හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමි යනාදී අග්‍රගණ්‍ය යතිවරයන් වහන්සේලා ද කැප්පෙටිපොළ නිලමේ, ගොංගාලේගොඩ බණ්ඩා, වීරපුරන්අප්පු යනාදී විරුවෝ ද මුල් තැනක් හිමිකර ගනිති. එමෙන් ම මෙම නාමාවලියට ඇතුළත් නොවුණ ද ඉතිහාසය තුළ සැඟව ගිය දහස් ගණනක් හෙළ විරුවෝ වූ හ.

එමෙන් ම මහත් සේ පරිශ්‍රමයක් දරා දිනාගත් නිදහස විවිධ මතිමතාන්තර ඔස්සේ දිනා ගැනීමට ද ඇතැම් බුද්ධිමත් නායකයෝ ප්‍රයත්න දැරූ හ. මහාමාන්‍ය ඩී. එස්. සේනානායක, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක, එෆ්. ආර්. සේනානායක, ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන්, ටී. බී. ජයා යනාදී නායකයෝ එහි පෙරමුණ ගත් හ. තව ද දේශීයත්වය හැරපියා බටහිර අනුකරණශීලී ගැත්තන් වෙමින් ක්‍රියා කළ සිංහල කළු සුද්දන් වෙතින් දිනෙන් දින පලා යමින් පැවැති දේශීයත්වය නැවත ඇති කිරීම සඳහා මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, විබෙට් ජාතික එස්. මහින්ද හිමි, අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිශ්චන්ද්‍රතුමා, පියදාස සිරිසේන යනාදී බුද්ධිමත්හු පියවර ගත් හ. මෙම පුනරුදයේ අවසානය වූයේ අපට අහිමි කළ නිදහස වර්ෂ 1948 දී අප වෙත ලබා ගැනීමට හැකිවීමෙනි.

1948 ට පෙර රටට නිදහස දිනා ගැනීම සඳහා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදි වශයෙන් බෙදීමක් නොකර ශ්‍රී ලාංකිකයන් ලෙස එක්ව කටයුතු කළ අප නිදහසින් පසු බරපතළ ලෙස වෙන්වී ගියේ හුදෙක් ජාති, කුල, ආගම්, පක්ෂ, පළාත් වශයෙන් සලකා භේදභින්නව ක්‍රියා කිරීම නිස යි. එවැනි අදහස් වලින් කිසියම් සමාජයක මූලික මිනිස් අයිතිවාසිකම් පැහැර හැරීමට හෝ යටපත් කිරීමට යමෙකු ක්‍රියා කළහොත් එය බෞද්ධ සහජීවනයට බරපතළ හානියකි. සෑම දෙනකු ම එක ම මිනිස් වර්ගයකට අයත් ඒකාකාරී පැවැත්මක් ඇතිව ජීවත්වන පිරිසක් බව වටහාගෙන බුද්ධිමත්ව ක්‍රියා කිරීම අන්‍යෝන්‍ය යුතුකම් වර්ධනය වීමට හේතු වේ.

වෙනත් සත්ත්ව වර්ගයා අතර ජීව විද්‍යාත්මකව වෙනස්කම් දැක්වීමට බොහෝ සාධක පැවතුණ ද මිනිසා පිළිබඳව එබඳු වෙනස්කම් දැක්විය නොහැකි බව බුදු දහමෙහි සාධක රාශියක් මගින් දක්වා තිබේ. ඒ අතර මිනිසුන් ගේ සිරුරු වෙන් වෙන් වශයෙන් ගත් කළ වෙනසක් නැති බවටත් ලිංග, ජාති වශයෙන් සමානත්වයක් ඇති බවටත් මජ්ජිම නිකායේ වාසෙට්ඨ සූත්‍රයේ සඳහන් වන කරුණු ඉතා වැදගත් ය.

සාමයෙන් හා සහජීවනයෙන් ජීවත්වීමට නම් සියලු ආගම් ඇදහිය යුතු යැයි, යමෙකු අදහස් කළහොත් එය සහමුලින්ම වැරැදි සහගත බවද තේරුම් ගත යුතු ය. සියලු ම ආගම් ඇදහීම උමතු ස්වභාවයක් මිස ආගමික සහජීවනය නො වේ. වෙසක් පොහොයට අන්‍ය ආගමිකයෝ වෙසක් පහන් කූඩු තනති. තොරණ ඉදිකිරීමට සහය වෙති. ආධාර උපකාර කරති. දන්සැල් දෙති. බෞද්ධයෝ ද අන්‍ය ආගමිකයන් ගේ හා අන්‍ය ජාතීන් ගේ උත්සවවලට උදව් උපකාර කරති. තම නිවෙස් හෝ ආයතන ඒ වෙනුවෙන් සරසති. එසේ ම පන්සලේ ධර්ම ශාලාව හෝ ප්‍රජාශාලාව ඔවුන් ගේ සමාජ සේවා රැස්වීම් ආදිය සඳහා ලබාදෙති. සහජීවනයේ සැබෑ ලක්ෂණය වන්නේ අන්‍යයන් ගේ ආගම හෝ සිරිත විරිත තමනුත් අනුගමනය කිරීම නොව ඔවුන් ගේ ආගම ඇදහීමට හා ඔවුන්ගේ සිරිත් විරිත් ඔවුන්ට පවත්වා ගෙන යාමට බාධා නොකිරීමයි. සිංහල බෞද්ධයා පෙර සිට ම මෙම පිළිවෙත අනුගමනය කළේ ය. අන්‍යෝන්‍ය සුහදත්වයෙන් යුතුව අනුගමනය කරන මෙම උතුම් පිළිවෙත ආගමික සහජීවනය යි. සිංහලකමත්, බෞද්ධකමත් යනු එය යි.

■ **ඌරුගමුවේ අස්සජි හිමි**

PRINTED FROM PRESSREADER
© 2017 NewspaperDirect